**03-01-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, අඛණ්ඩව සෑම පියවරකදීම ශ්‍රීමත් අනුගමනය කරන්න. මේවා බ්‍රහ්මගේ උපදෙස්ද, ශිව බාබාගේ උපදෙස්ද කියා ව්‍යාකූලත්වයට පත් නොවන්න.

**ප්‍රශ්නය:** හොඳ මොළ ඇති දරුවන්, පහසුවෙන්ම වටහා ගන්නේ කුමන ගැඹුරු දේවල්ද?

**පිළිතුර:** විස්තර කරන්නේ, බ්‍රහ්ම බාබාද නැත්නම් ශිව බාබාද කියා, හොඳ මොළ ඇති දරුවන්ට වැටහෙයි. සමහරු මේ ගැන අවුලට පත්වෙයි. බාබා පවසන්නේ : දරුවනි, බාප් සහ දාදා යන දෙදෙනාම සිටින්නේ එකටයි. එබැවින්, අවුලට පත් නොවන්න. එය ශ්‍රීමත් බව සලකමින් දිගටම ඉදිරියට යන්න. ඔබට බ්‍රහ්මගෙන් ලැබෙන කුමන හෝ උපදෙස් වලට, ශිව බාබා වග කියයි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා, ඔය දරුවන්ට විස්තර කරයි. ආධ්‍යාත්මික පියාව හඳුනන්නේ ඔය බ්‍රාහ්මණයන් පමණක් බව ඔබට වැටහෙයි. ලෝකයේ කිසිම මනුෂ්‍යයෙක්, ආධ්‍යාත්මික පියාව, දෙවියන් ලෙස හැඳින්වෙන කෙනාව, පියා, පරමාත්ම පියා සහ පරමාත්ම ජීවයව නොදනී. ආධ්‍යාත්මික දරුවන්ට එම හැඳින්වීම ඔහුට ලබා දිය හැකි වන්නේ, ආධ්‍යාත්මික පියා පැමිණි විට පමණයි. මෙම ඥානය ලෝකයේ ආරම්භයේ හෝ ලෝකයේ අවසානයේ නොපවතී. මෙය, පැරණි ලෝකයේ අවසානය සහ නව ලෝකයේ ආරම්භය අතර ඇති සංගමයයි, යන ඥානය ඔබට දැන් ලබා දී තිබේ. ඔබ මෙම සංගම යුගය ගැන නොදැන සිටි බැවින් ඔබ පරම පියාව දන්නේ කෙසේද? ඔවුන් පවසන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, වඩිනු මැනව! පැමිණ අපව පිවිතුරු කරන්න! කෙසේවෙතත්, පාරිශුද්ධකරු යනු කවරෙක්ද හෝ ඔහු පැමිණෙන්නේ කවදාද කියා ඔවුන් නොදනී. පරම පියා පවසන්නේ මා කොයි වගේද, කවුරුන්ද, කියා කිසිවෙකු මාව නොදනී. මා පැමිණ, මගේ හැඳින්වීම ලබා දුන් විට පමණයි, කවුරු වුවත් මාව හඳුනගන්නේ. එක් වරක්, සංගම යුගයේදී පමණයි, මා මගේ හැඳින්වීම සහ ලෝකයේ මුල, මැද සහ අවසානය ගැන ඔබට කියන්නේ. මා සෑම චක්‍රයකදීම එක් වරක් පැමිණෙන්නෙමි. මා ඔබට විස්තර කරන සෑම දෙයක්ම ඉන්පසුව අතුරුදහන් වෙයි. ස්වර්ණමය යුගයේ සිට කලි යුගයේ අවසානය දක්වා, කිසිම මනුෂ්‍යයෙක් උත්තරීතර පියා වන මාව හෝ බ්‍රහ්ම, විෂ්ණු හෝ ශංකර් පිළිබඳවද නොදනී. මාහට අඬගසන්නේ මනුෂ්‍යයන්ය. බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර් මට අඬගසන්නේ නැත. මනුෂ්‍යයින් දුක් විඳින විටයි ඔවුන් අඬගසන්නේ. සූක්ෂම දේශයේ මේ ගැන ප්‍රශ්නයක් නැත. ආධ්‍යාත්මික පියා පැමිණ මෙහි අසුන් ගෙන ඔහුගේ ආධ්‍යාත්මික දරුවන්ට එනම්, ජීවාත්මයන්ට විස්තර කරයි. අච්චා, ආධ්‍යාත්මික පියාගේ නම මොකක්ද? බාබා කියා හඳුන්වන කෙනාට නිසැකයෙන්ම නමක් ඇති. සැබවින්ම, ශිවා යන එක් නාමය සිහිකෙරෙයි. එම කෙනාගේ නම බොහෝ සුප්‍රසිද්ධයි, නමුත් මනුෂ්‍යයන් ඔහුට බොහෝ නම් දී තිබේ. භක්ති මාර්ගයේ, නම ශිව වන නමුත්, ඔවුන්ගේම බුද්ධිය භාවිත කර, ඔවුන් ශිවලිංගම ස්වරූපය නිර්මාණය කර ඇත. පරම පියා පවසන්නේ මා පැමිණෙන්නේ එක්වරක් පමණයි. මා පැමිණ, ඔබට විමුක්තිය සහ ජීවන-මුක්තිය යන ඔබගේ උරුමය ඔබට ලබාදෙනවා. මනුෂ්‍යයන් විමුක්ති දේශය සහ නිර්වාණ දේශය ගැන කතා කරන නමුත්, ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ඔවුන් පරමාත්ම පියාව හෝ දේවතාවන්ව නොදනී. පියා භාරතයේ පැමිණ, රාජධානියක් ස්ථාපනය කරන අන්දම ගැන කිසිම කෙනෙකුට වැටහෙන්නේ නැත. මේ එක් දෙයක්වත් ග්‍රන්ථ වල සඳහන් වන්නේ නැත. උත්තරීතර පියා පැමිණ, දේවතා ධර්මය ස්ථාපිත කරන්නේ කෙසේද? ස්වර්ණමය යුගයේ දේවතාවන්ට පසුව අතුරුදහන් වුණු ඥානය, තිබුණේ නැත නැහැ. දේවතාවන්ට මෙම ඥානය තිබුණේ නම්, එය එතැන් සිට පැවතෙනු ඇත. ඉස්ලාමිකයන්ගේ සහ බෞද්ධයින්ගේ දැනුම දිගටම පැවතී තිබේ. මෙම ඥානය අතුරුදහන් වන බව, ඔබ සියල්ලන්ම දනී. අපවිත්‍ර වී, තම රාජධානිය අහිමි වී ඇති ජීවාත්මයන්ව, මා පැමිණි විට, පිවිතුරු කරන්නෙමි. භාරතයේ ඔබගේ රාජධානිය පැවතුණි, එබැවින් ඔබට එය අහිමි වූයේ කෙසේද? කිසි කෙනෙක් මෙයවත් නොදනී. මේ නිසයි පරම පියා පවසන්නේ ඔය දරුවන්ගේ බුද්ධි, බොහෝ පහත් වී තිබේ! මා පැමිණ ඔබට මෙම ඥානය ලබා දී, ඉන්පසුව ඔබට ඔබගේ ප්‍රතිලාභය දෙන්නෙමි. පසුව ඔබ සෑම කෙනෙක්ම සියල්ල අමතක කරයි. පරම පියා පැමිණ, ඔබට සියලුම ඉගැන්වීම් ලබා දුන් ආකාරය ඔබට අමතක වෙයි. මෙයත් නාටකයේ නියම වී තිබේ. ඥානයේ සාගරය මතගැමට ඔය දරුවන්ට පුළුල් බුද්ධි තිබිය යුතුයි. පරම පියා පවසන්නේ ඔබ පසුව හැදෑරූ ග්‍රන්ථ, ඔබ ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී හැදෑරුවේ නැත ඒවා එහි පැවතුනේ නැත. ඔබට මෙම ඥානය අමතක විය. එබැවින් ගීතාව සහ ග්‍රන්ථ ආදිය පැමිණියේ කොහේ සිටද? ගීතාවට සවන් දී තත්ත්වයක් හිමිකර ගත් අයට

කිසි දෙයක් වැටහුනේ නැත. එබැවින් අන් අයට කිසිවක් වැටහෙන්නේ කෙසේද? ඔවුන් සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වූයේ කෙසේද කියා, දේවතාවන්වත් නොදනී. ඔබගේ උත්සාහ දැරීමේ කොටස අවසන් වී, ඔබගේ ප්‍රතිලාභය ආරම්භ විය. මෙම ඥානය එහි පවතින්නේ කෙසේද? පරම පියා විස්තර කරන්නේ ඔබට පෙර චක්‍රයේදී ලැබුණු එම ආකාරයෙන්ම නැවත වරක් මෙම ඥානය ලැබෙමින් පවතිනවා. ඔබට රාජයෝගාව උගන්වා ඉන්පසුව ප්‍රතිලාභය ලබා දෙනවා. එහි පහත්වීමක් සිදුවන්නේ නැත. එබැවින් ඥානය පිළිබඳ ප්‍රශ්නයක් එහි පැන නැඟෙන්නේ නැත. මෙම ඥානය තිබෙන්නේ විමුක්තිය ලබා ගැනීම සඳහාය. ඔබට මෙය ලබා දෙන්නේ ඒකායන පියා පමණයි. 'විමුක්තිය' සහ 'පහත් වීම' යන වචන මතුවන්නේ මෙහිදීය. මුක්තිය ලැබෙන්නේ භාරතයේ මිනිසුන්ට පමණයි. දෙව්ලොව දෙවි පියාණන්, දිව්‍යලෝකය නිර්මාණය කළ බව, ඔවුන් විශ්වාස කරයි. එය නිර්මාණය වූයේ කවදාද යන්න, ඔවුන් කිසි දෙයක් නොදනී. ග්‍රන්ථවල වසර සිය දහස් ගණනක් සඳහන් කර ඇත. පරමාත්ම පියා පවසන්නේ දරුවනි, මා නැවත වතාවක් ඔබට මෙම ඥානය ලබා දෙනවා. පසුව, මෙම ඥානය අතුරුදහන් වූ පසු, භක්තිය ඇරඹෙයි. චක්‍රයෙන් භාගයක් ඥානයත්, චක්‍රයෙන් භාගයක් භක්තියත් තිබෙයි. කිසි කෙනෙකුට මෙය වැටහෙන්නේද නැත. ඔවුන් ස්වර්ණමය යුගයට වසර සිය දහසක කාල පරාසයක් දී තිබේ. එබැවින් ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ කෙසේද? ඔවුන්ට වසර 5000 කදී සිදු වූ සෑම දෙයක්ම අමතක වී ඇත්නම්, වසර සිය දහස් ගණනක දේ ගැන දන්නේ කෙසේද? ඔවුන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. පරම පියා සෑම දෙයක්ම ඉතා පහසුවෙන් විස්තර කරයි. චක්‍රයේ කාල වකවානුව වසර 5000 ක් වන අතර එහි යුග 4 ක් පමණක් තිබේ. යුග හතරට වසර 1250 ක් බැගින් වූ සමාන කාලයක් තිබේ. මෙය බ්‍රහ්මණයින්ගේ කුරු යුගයයි. යුග හතර හා සසඳන විට, මෙම යුගය ඉතා කෙටියි. පියා ඔබට බොහෝ විවිධ ආකාරවලින් අළුත් කරුණු විස්තර කරයි. එබැවින් ඔබ ඒවා ධාරණය කරගත යුතුයි! තවද ඔබ උත්සාහද දැරිය යුතුයි! ඔහු ඔබට විස්තර කර දෙන කොටස නාටකයට අනුව දිගටම සිදුවෙයි. අද දින, මා විසින් ඔබට කීමට තිබුණු දේ කුමක්ද, මා ඔබට කියන්නේ එයයි එය දිගටම මතුවෙයි. ඔබ දිගටම සවන් දෙයි. ඔබ එය ධාරණය කර, තවද වෙනත් අයට එය ධාරණය කිරීමට දිරිමත් කළ යුතුයි. මා ඔබට එය පවසා, එය ධාරණය කරගැනීමට ඔබව දිරිමත් කරවනවා. අපවිත්‍ර අයව පිවිතුරු කිරීමේ කොටස තිබෙන්නේ මගේ ජීවාත්මයටයි. මා ගිය චක්‍රයේ පහදා දුන් යමක් ඇත්ද, එය දිගටම මතු වෙනවා. මෙම ජීවාත්මය ඥානයේ සාගරය මතගාන නමුත්, මා ඔබට කියන්න යන්නේ කුමක්ද කියා, මා පෙරාතුව නොදනී. සෑම දෙයක්ම ආවර්ජනය කර, ඔබට පවසන්නේ මෙම කෙනාද, නැත්නම් කතා කරන්නේ බාබාද යන්න, ඉතා ගැඹුරු කාරණාවකි. මේ සඳහා ඉතා හොඳ මොළයක් අවශ්‍ය වෙයි. සේවයේ කාර්ය බහුලව සිටින අය, නිරන්තරයෙන් ඥානයේ මහා සයුර කලතයි. ඇත්ත වශයෙන්ම කුමාරීන් බන්දනයන්ගෙන් නිදහස්ය. ඔවුන්ට කිසිම බන්දනයක් නොමැති නිසා, ඔවුන්ට මෙම ආධ්‍යාත්මික ඉගෙනුමෙහි කාර්ය බහුල විය හැක. කුමාරීන්ට ඉතා හොඳින් මෙම ඥානය ලබා ගත හැක. ඔවුන් ඉගෙනගෙන, වෙනත් අයට ඉගැන්විය යුතුයි. ඔවුන්ට ආදායමක් උපයාගැනීමට අවශ්‍ය නැත. කුමාරීන් මෙම ඥානය ඉතා හොඳින් වටහාගත් විට, ඔවුන්ට ඉතා හොඳ විය හැක. ඔවුන්ට නුවණ ඇත්නම්, ඔවුන් මෙම ආදායම ඉපැයීමේ තමන්ව නිරත කරගනී. ඇතැම් අය විශාල උනන්දුවකින් ලෞකික ඉගෙනුමක් හදාරති. එම ඉගෙනුමෙන් ප්‍රයෝජනයක් නොමැති බව, විස්තර කරදී ඇත. ඔබට මෙහි මෙම ආධ්‍යාත්මික ඉගෙනුම හදාරා, සේවය කිරීමේ කාර්යබහුල විය හැක. එම ඉගෙනුමෙන් ඇති ඵලයක් නැත. ඔවුන් ඉගෙනගෙන පසුව ගෘහිණියන් වී, ගේදොර වැඩ වල තමන්ව නිරත කරගනී. කුමාරීන් මෙම ඥානයේ තමන්ව කාර්යබහුල කරගත යුතුයි. ඔබ සෑම පියවරකදීම ශ්‍රීමත් අනුගමනය කර, ඉන්පසුව මේ සියල්ල ධාරණය කරගැනීමේ තමන්ව නියැලිය යුතුයි. මම්මා ආරම්භයේ පැමිණ, මෙම ඉගෙනුමේ නියැලුණා. බොහෝ කුමාරීන් දැන් අතුරුදහන් වී ඇත. කුමාරීන්ට ඉතා හොඳ අවස්ථාවක් තිබේ. ඔබ ශ්‍රීමත් පිළිපදින්නේ නම්, ඔබට හොඳ ප්‍රථම පංතියේ කෙනෙක් විය හැක. මේවා ශ්‍රීමත්ද එසේනැත්නම් බ්‍රහ්මගේ උපදෙස්ද කියා බොහෝ දෙනෙක් අවුලට පත් වෙයි. කෙසේවෙතත්, මෙය බාබාගේ රථයයි. ඔබ ශ්‍රීමත් පිළිපැද, මෙම කෙනා අතින් වරදක් සිදුවන්නේ නම්, එවිට එම කෙනා, සෑම දෙයක්ම නිවැරදි කරනු ඇත. ඔබට ශ්‍රීමත් ලැබිය හැක්කේ මෙම කෙනාගේ මාර්ගයෙන් පමණයි. ඔබට ශ්‍රීමත් ලැබෙන බව, සෑම විටෙක මතක තබා ගන්න. එවිට, කුමක් සිදුවුණත් ඔහුම එයට වගකියයි. මෙම කෙනා අතින් යමක් සිදුවුණොත්, එවිට බාබා පවසන්නේ මා එයට වගකියනවා. මෙම රහස නාටකයේ නියම වී ඇත. ඔහුට මෙම කෙනාවත් පරිවර්ථනය කළ හැක. කොහොම වුණත් ඔහු පියායා! බාප් සහ දාදා යන දෙදෙනාම සිටින්නේ එකටයි. මේ නිසයි ඔබ අවුලට පත් වී මෙසේ කියන්නේ 'මෙය කියන්නේ ශිව බාබාද නැත්නම් බ්‍රහ්ම බාබාද කියා මා නොදනී.' ඔබට උපදෙස් ලබා දෙන්නේ ශිව බාබා පමණක් බව ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබ කිසි විටෙක චංචල නොවනු ඇත. ශිව බාබා කුමක් විස්තර

කළත් එය නිවැරදියි. ඔබ පවසන්නේ බාබා, ඔබ මගේ පියා, ගුරුවරයා මෙන්ම ගුරුය. එබැවින් ඔබ ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි, එහෙම නේද? ඔහු ඔබට කුමක් කීවත්, ඔබ එය පිළිපැදිය යුතුයි. ඔබට කතා කරන්නේ ශිව බාබා බව, සැම විටෙකම සලකන්න. ඔහු සෙත සලසන්නාය. මෙම කෙනාගේ වගකීම තිබෙන්නේ එම කෙනා සමඟයි. මෙම කෙනා ඔහුගේ රථයයි. ඔබ අවුලට පත් වී මෙසේ පවසන්නේ ඇයි 'මෙය බ්‍රහ්මගේ අවවාදද, නැත්නම් ශිව බාබාගේද කියා මා නොදනී? ' සැම දෙයක්ම විස්තර කරන්නේ ශිව බාබා පමණක් බව, ඔබට වැටහෙන්නේ නැත්තේ ඇයි? ශ්‍රීමත් ඔබට කියන දේ දිගටම කරන්න. ඔබ අන් අයගේ උපදෙස් අනුගමනය කරන්නේ ඇයි? ඔබ ශ්‍රීමත් අනුගමනය කරන විට, ඔබ කිසි විටෙක නිදි කිරන්නේ නැත. කෙසේවෙතත්, ඔබ අවුලට පත්වන බැවින් ඔබට එය අනුගමනය කිරීමට නොහැකි වී තිබේ. බාබා පවසන්නේ ශ්‍රීමත් ගැන විශ්වාස තබන්න, එවිට මා වගකියනවා. ඔබට විශ්වාසය නොමැති නම්, මා වගකියන්නේ නැත. ඔබ ශ්‍රීමත් පිළිපැදිය යුතු බව, සැම විටෙකම වටහා ගන්න. 'ඔබ අපට සෙනෙහස පෑවත් අපට පහර දුන්නත්' කියා ගායනා කරන විට, එසේ ගයන්නේ එම කෙනා පිළිබඳවයි. මෙහිදී කෙනෙකුට පා පහරක් ගැසීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. කෙසේවෙතත්, කෙනෙකුට විශ්වාසය ඇති කිරීම බොහෝ අපහසු දෙයකි. ඔබට සම්පූර්ණ විශ්වාසය තිබෙන්නේ නම්, ඔබගේ කර්මතීට් තත්ත්වයට ඔබ පත්වනවා ඇති, නමුත් එම තත්ත්වයට පත්වීම සඳහා කාලයක් අවශ්‍යයි. අවසානයේදී ඔබගේ තත්ත්වය එය වෙයි. මේ ගැන ඔබගේ විශ්වාසය නොසෙලවී තිබීම අවශ්‍යයි. ශිව බාබාට කිසිසේත් වැරදීමක් සිදුවිය නොහැක. මෙම කෙනාට වැරදීම් සිදුවිය හැක. අප දෙදෙනා සිටින්නේ එකටයි. කෙසේවෙතත්, විස්තර කරන්නේ ශිව බාබා බව ඔබට විශ්වාසයක් තිබිය යුතු මෙන්ම, එබැවින් ඔහු කියන දේ ඔබ පිළිපැදිය යුතුයි. එබැවින් එය ශිව බාබාගේ ශ්‍රීමත් බව සලකා ඉදිරියට ගමන් කරන්න, එවිට වැරදි යමක් ඇතොත් එය නිවැරදි කෙරෙනු ඇත. සමහර අවස්ථාවන්හිදී වැරදි වැටහීම් ඇතිවෙයි. ශිව බාබාගේ සහ බ්‍රහ්ම බාබාගේ මුරලි බොහෝ පැහැදිලිව වටහා ගත යුතුයි. එය බාබා කීවත් මෙම කෙනා කීවත් කම් නැත. බ්‍රහ්ම කිසිසේත් කතා නොකර සිටිනවා නොවෙයි. කෙසේවෙතත්, එය විස්තර කළේ බාබාය. බ්‍රහ්ම කිසිදෙයක් නොදන්න බව සහ සැම දෙයක්ම පවසන්නේ ශිව බාබා බව පමණක් වටහා ගන්න. 'මා ශිව බාබාගේ රථය නාවනවා. මා ශිව බාබාගේ මුළුතැන්ගේහි සේවය කරනවා'. ඔබ මෙය පමණක් සිහිකරන්නේ නම් එයත් ඉතා හොඳයි. ශිව බාබාගේ සිහිකිරීමේ සිට, සැම දෙයක්ම කරන්න, එවිට ඔබට බොහෝ දෙනෙකුට ඉදිරියෙන් යා හැක. ප්‍රධානතම දෙය වන්නේ ශිව බාබාගේ සිහිකිරීමයි ආල්ෆා සහ බීටා, අන් සියල්ල විස්තාරණයයි. පියා විස්තර කරන සැම දේකටම අවධානය යොමු කරන්න. පාරිශුද්ධකරු සහ ඥානයේ සාගරය වන්නේ පරමාත්ම පියාම පමණයි. අපවිත්‍ර ශුද්‍රයින්ව බ්‍රහ්මණයන් බවට පරිවර්ථනය කරන්නේ ඔහු පමණයි. ඔහු පිවිතුරු කරන්නේ බ්‍රහ්මණයින්ව පමණයි. ඔහු ශුද්‍රයින්ව පිවිතුරු කරන්නේ නැත. භගවතය ආදියේ මේ කිසි දෙයක් සඳහන් කර නැත. මින් සමහර වචන ඒවායේ සඳහන් වී ඇත. රාධේ සහ ක්‍රිෂ්ණා, ලක්ෂ්මි සහ නාරායන බවට පත්වන බවවත්, මිනිසුන්ට නොවැටහෙයි. මිනිසුන් මේ ගැන අවුලට පත්වෙයි. දේවතාවන් සූර්ය වංශයේ සහ චන්ද්‍ර වංශයේ කොටස්ය. ලක්ෂ්මි සහ නාරායනගේ සහ රාමා, සීතාගේ රජ පෙළපත් තිබේ. පරම පියා පවසන්නේ අහෝ භාරතයේ ජනතාවනි, සුමිහිරි දරුවනි, මෙය පමණක් සිහියේ තබාගන්න! එය වසර සිය දහස් ගණනක් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඔබට රාජධානිය ලබාදුන්නේ පෙරදිනයේ වැනිය. එකල ඔබට බොහෝ ධනය සහ සමෘද්ධිය ලබා දුන්හ. පරමාත්ම පියා, ඔබව මුළු ලෝකයේම අධිපතියන් බවට පත්කළා. එකල වෙනත් දේශ නොතිබිණි. ඉන්පසුව ඔබට සිදුවූයේ කුමක්ද? කිසිම ශාස්ත්‍රවරයෙක්, පණ්ඩිතයෙක් ආදීන් මෙම දේවල් පිළිබඳව නොදනී. පරම පියා පමණයි මෙසේ පවසන්නේ අහෝ භාරතයේ ජනතාවනි, මා ඔබට ඔබගේ රාජධානියේ භාග්‍යය ලබා දුන්නා. ඔබ වෙනත් අයටද පවසන්නේ ශිව බාබා පවසනවා මා ඔබට බොහෝ ධනය ලබා දුන්නා! එබැවින් ඔබ ඒ සියල්ල නැති කරගත්තේ කොහේදිද? පියාගේ උරුමය බොහෝ ශ්‍රේෂ්ඨයි! පරම පියාම ඔබගෙන් විමසනවා! ඔබගේ පියා පිටව ගිය පසු (මිය ගිය පසු) ඔබගේ නෑදෑ මිතුරන් ඔබගෙන් විමසන්නේ ඔබගේ පියා ඔබට ඉතිරි කළ ධනයෙන් ඔබ කළේ කුමක්ද? එම කෙනා අසීමිත පියාය. පියා ඔබව සිප්පි කටුවලින්, දියමන්ති බවට පත්කළා. ඔහු ඔබට එවන් රාජධානියක් ලබා දුන්නා! එබැවින් එම සියලු ධනය කොහේ ගියාද? ඔබ ඔහුට පිළිතුරු දෙන්නේ කෙසේද? වෙනත් කිසිවෙක් කිසි දෙයක් වටහා නොගනී. බාබා විමසන දේ නිවැරදි බව ඔබට වැටහෙයි. ඔබ මෙතරම් දුප්පත් වූයේ කෙසේද? ආරම්භයේදී සැම දෙයක්ම සතෝප්‍රධාන්ව පැවති අතර පසුව අංශක ක්‍රම ක්‍රමයෙන් අඩුවිය. එබැවින් අන් සැම දෙයකම අඩු වීමද සිදු විය. ස්වර්ණමය යුගයේදී ඔබ සතෝප්‍රධාන් විය එය ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය විය. 'ලක්ෂ්මි සහ නාරායනෙ' යන නම 'රාධේ සහ ක්‍රිෂ්ණා' යන නම් වලට වඩා බොහෝ සුප්‍රසිද්ධයි. ලක්ෂ්මි සහ නාරායනව අපහාසයට පත් කිරීමක් සිදු වන්නේ නැත. අන් සැම කෙනෙක් පිළිබඳව අපහාසාත්මක දේවල් ලියා ඇත. ලක්ෂ්මි සහ නාරායනගේ

රාජධානියේ, රකුසන් පෙන්වා නැත. එබැවින් මෙම දේවල් වටහාගත යුතුයි. බාබා ඔබගේ ඒප්‍රන, ඥානයේ ධනයෙන් පුරවනවා. පරමාත්ම පියා පවසන්නේ : දරුවනි, එම මායාගෙන් ප්‍රවේසම් වන්න! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. නුවණ ඇත්තන් වී, තමන්ව සත්‍ය සේවයේ නිරත කරවන්න. ඒකායන පියා, වගකීම දරයි. එබැවින් ශ්‍රීමත් පිළිබඳව සැක ඇතිකර නොගන්න. අචල විශ්වාසය තබාගන්න.
2. ඥානයේ මහා සයුර කලතා, පරම පියා විස්තර කරන සෑම දේකටම අවධානය යොමු කරන්න. ඔබ තුළ ඥානය ධාරණය කරගෙන, ඉන්පසුව අන් අයට එය පවසන්න.

**වරදානය:** ඔබ ජීවාත්මයන්ගේ මුල් සහ සදාතනික ස්වරූප දෙකම නිර්මල ය. අපිරිසිදුකම කෘත්‍රිම ය, එය ශුද්‍රයන්ගෙන් ලැබුණු තෑග්ගකි. බ්‍රාහ්මණයන්ට ශුද්‍රයන්ට අයත් දේවල් භාවිත කළ නොහැක, එබැවින්, සිතිවිල්ලක් තබාගන්න: මගේ මුල් සහ සදාතනික, සැබෑම ස්වරූපයෙන්, මෙම ජීවාත්මය වන මම, පිරිසිදු ජීවාත්මයක්මි. ඔබ අන් අය දෙස බලන සෑම විටම, ඔවුන්ගේ සැබෑම ස්වරූපයන් දෙස බලන්න. ඔබේ සැබෑ ස්වරූපය අවබෝධ කර ගන්න, එවිට ඔබ සම්පූර්ණයෙන්ම නිර්මල වී පළමු පන්තියේ, වායුසමීකරණය කළ ටිකට් පතක් ලබා ගනු ඇත.

**පාඨය:** මායාට ඔබට සමීප වීමට නොහැකි වන පරිදි ඔබේ ඒප්‍රනය පරමාත්ම දෙවියන්ගේ ආශීර්වාද වලින් පුරවාගන්න.

***** ඔම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

බොහෝ දරුවන් දැන් ඔවුන්ගේ යකඩ දම්වැල් කපා දමා ඇත, නමුත් ඔවුන්ගේ ඉතා සියුම් නූල්පටවල් තවමත් පවතී. ඔවුන්ට හොඳ පෞරුෂයක් ඇති බව හැඟෙන බොහෝ දෙනෙක් සිටිති. ඔවුන් තුළ යහපත්කම නොතිබිය හැකි නමුත්, ඔවුන් ඉතා හොඳ බවත් ඔවුන් ඉතා ඉක්මණින් ඉදිරියට යන බවත් ඔවුන්ට හැඟේ. ඔබගෙන් බහුතරයකට බන්ධන ජීවිතයක සිටීමේ එම නූල්පටවල් තිබේ. බාප්දාදා දැන් ඔබව එම නූල්පට වලින් නිදහස් සහ ජීවන මුක්ති ලද බව දැකීමට ප්‍රාර්ථනා කරයි.